# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2515/11 - 2026 නොවැම්බර් මස 17 වැනි අඟහරුවාදා - 2026.11.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**හික්කඩුව නගර සභාව**

විනෝද බඳු පැනවීම

1946 අංක 12 දරන විනෝද බඳු ආඥාපනතේ දෙවන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර ගාල්ල දිස්ත්‍රික්කයේ හික්කඩුව නගර සභාව විසින් 2025.10.15 වන දින පවත්වන ලද සභා රැස්වීමේ තීරණ අංක ඉ (8) යටතේ සම්මත කරන ලද පහත යෝජනාව වන දින 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු විනෝද බඳු ආඥාපනතේ දෙවන වගන්තියේ (2) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර දකුණු පළාතේ ආණ්ඩුකාරවර ආචාර්ය සුසිරිපාල මානවඩු වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් කාරුණිකව නිවේදනය කරනු ලැබේ.

**ආචාර්ය සුසිරිපාල මානවඩු,**
දකුණු පළාත් ආණ්ඩුකාරවර.

2026 ඔක්තෝබර් මස 06 වැනි දින,
දකුණු පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1946 අංක 12 දරන විනෝද බඳු ආඥාපනතේ දෙවන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර හික්කඩුව නගර සභාව, සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට කරනු ලබන ගෙවීමකින් විනෝද කටයුතු සඳහා ප්‍රවේශ පත්‍ර වටිනාකමින් 10% කට සමාන මුදලක් බද්දක් වශයෙන් පනවා අය කළ යුතු යැයි ද, මෙම යෝජනාව 2026.01.01 දින සිට අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතු යැයි ද, යෝජනා කරන්නී ය. එසේම ඉහත පනවන ලද විනෝද බද්ද එකී විනෝද කාර්යය පවත්වන දිනට පෙර අදාළ සංවිධායක හෝ සංවිධායකවරුන් විසින් නිසි ලෙස හික්කඩුව නගර සභාවට ගෙවිය යුතු බවටත්, හික්කඩුව නගර සභාව වැඩදුරටත් යෝජනා කරන්නී ය.

EOG 11 - 0116



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*